සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## ඉතිහාසය

**නම/විභාග අංකය :-** ...................................................................................... **කාලය : පැය 02 යි.**

### I කොටස

- **මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.**
- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(1) අතීත කාලයේ සිට ජීවත් වූ .............................................. පිළිබඳ කථාව ඉතිහාසයයි. (සත්වයින්, මිනිසුන්, උගතුන්)

(2) අතීත කාලවල මිනිසුන් විසින් කළ කී දෑ පිළිබඳ දැන ගැනීමට ඉවහල් වන දෑ .............................................. වේ. (මූලාශ්‍ර, පොත්පත්, පුරාවිද්‍යා මූලාශ්‍ර)

(3) බුද්ධ පරිනිර්වාණය සමග .............................................. ආරම්භ වේ. (ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ, ශක වර්ෂ)

(4) අප ජීවත් වන පෘථිවියේ මුලින් ම ජීවීන් බිහි වූයේ .............................................. ය. (ජලයේ, ගොඩබිම, කඳුකරයේ)

(5) සතුන්ගේ ඇටකටු භාවිත කරමින් නිවාස ඉදි කරන ලද්දේ .............................................. මානවයාය. (හෝමෝ ඉරෙක්ටස්, හෝමො හැබිලස්, හෝමෝ නියන්ඩතාලන්සිස්)

- අංක 06 - 10 තෙක් ප්‍රකාශ කියවා නිවැරදි නම් 3 ලකුණ ද වැරදි නම් X ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(6) අතීතයේ මිනිසුන් භාවිත කළ මෙවලම්, පැරණි ගොඩනැගිලි පිළිම ආදිය පුරා විද්‍යා මූලාශ්‍ර වේ. (...........)

(7) ලෝකයේ පැරණි ම අක්ෂර පද්ධතිය නිර්මාණය කළේ මෙසොපොතේමියානු වැසියන් විසිනි. (...........)

(8) විජය කුමරු ඇතුලු පිරිස ගොඩ බසින ලද්දේ තම්බපණ්ණි ප්‍රදේශයටය. (...........)

(9) පෘථිවිය සෑදී ඇත්තේ අහසේ තිබූ නිහාරිකාවක් මගින් බව විද්‍යාඥයින්ගේ මතයයි. (...........)

(10) මුල් වරට රබර් බෝලයක් නිපදවීමේ ගෞරවය හිමි වන්නේ ඊජිප්තු වැසියන්ට ය. (...........)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිත කිරීම පිළිබඳ සාක්ෂි ලැබෙන්නේ,
(i) චීනයෙනි (ii) ඉන්දියාවෙනි
(iii) ඊශ්‍රායලයෙනි (iv) තුර්කියෙනි

(12) පෘථිවියේ බිහි වූ ජීවයක් සහිත පළමු බැක්ටීරියාව හඳුන්වන්නේ,
(i) ඔපබීනියා (ii) නිහාරිකාව
(iii) ප්‍රොකායෝට් (iv) ඔස්ට්‍රලෝපිතස්

(13) වෙඩි බෙහෙත්, කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය ආදිය ලොවට හඳුන්වා දුන්නේ,
(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි.
(iii) චීන ශිෂ්ටාචාරයයි. (iv) ඊජිප්තු ශිෂ්ටාචාරයයි.



LIVEWORKSHEETS

(14) පරිනාමයට පත් වූ මානවයන්ගේ ස්ථිර වාසස්ථාන සහිත ගම්මාන බිහි වන්නේ,
(i) මහා හිම යුගයේ ය. (ii) සිලුරියන් යුගයේ ය.
(iii) නව ශිලා යුගයේ ය. (iv) මධ්‍ය ශිලා යුගයේ ය.

(15) නිවාසවල භාවිත කළ දියුණු ජල නල පද්ධතියක් හමු වී ඇත්තේ,
(i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි. (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙනි.
(iii) ඊජිප්තු ශිෂ්ටාචාරයෙනි. (iv) චීන ශිෂ්ටාචාරයෙනි.

I **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට හිස්තැන්ට සුදුසු පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

(16) මිනිසා දඩයම් කිරීම වෙනුවට ගස්වල ගෙඩි වර්ග අල වර්ග වැඩි වශයෙන් භාවිතා කළේ ................................................ යුගයේ දී ය.

(17) අතීතයේ මෙසපොතේමියාව ලෙස හැඳින් වූ රට වර්තමානයේ හැඳින්වෙන්නේ ................................................ නමිනි.

(18) මෙසපොතේමියානු සමාජයේ ජීවත් වූ උසස් ම පිරිස ලෙස හැඳින් වූයේ ................................................ ය.

(19) මුහුණේ තිබෙන වෙනස්කම් අනුව අප්‍රිකානු ප්‍රදේශවල ජීවත් වන්නේ ................................................ වරුය.

(20) වී වගාව මුලින් ම ආරම්භ කරන ලද්දේ ................................................ ය. (ලකුණු 2x20 = 40)



LIVEWORKSHEETS